2019. 9. 26. අද

පිටුව 13

# IMF, ශ්‍රී ලංකාවේ විස්තීරණ ණය පහසුකමෙහි 6 වැනි සමාලෝචනය පිළිබඳ නිලධාරී මට්ටමේ එකඟතාවක්

## - 2019 මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2.7%ක්

## - 2020 ද.දේ.නි. වර්ධනය 3.5%ක් බවට පුරෝකථනයක්

**ෂමිල පෙරේරා**

සිව් අවුරුදු විස්තීරණ ණය පහසුකම් සැලසුම යටතේ ක්‍රියාත්මක කෙරෙන ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ 6 වැනි සමාලෝචනය පිළිබඳව ජා.මූල අරමුදලේ නිලධාරී කණ්ඩායම සහ ශ්‍රී ලංකා බලධාරීන් අවබෝධතාවන්ට එළැඹ තිබේ.

මෙම සමාලෝචනය පැවැත්වීම සඳහා මැනුඑලා ගොරෙති මහත්මියගේ ප්‍රධානත්වයෙන් යුතු ජා.මූ.අරමුදලේ නිලධාරී කණ්ඩායමක් පසුගිය 10දා සිට 25දා දක්වා කොළඹ රැඳී සිටි අතර, මෙම සමාලෝචනය සඳහා සපුරාලිය යුතු සියලුම



කාර්යයන් සහ ව්‍යුහාත්මක මිණුම් දඬු නිම කිරීමට අවශ්‍ය පියවර ඊළඟ සති කිහිපය තුළදී බලධාරීන් විසින් ගනු ඇති බවද ජා.මූ. අරමුදල නිවේදනය කරයි.

මැනුඑලා ගොරෙති මහත්මිය පෙන්වා දෙන්නේ, ආර්ථිකය අඛණ්ඩව යථා තත්ත්වයට පත්වීම සහ සමාජ අරමුණු සඳහා සහාය වීමට අවකාශය සලසමින්, රාජ්‍ය ණය තිරසාරභාවය පවත්වා ගැනීමට අවශ්‍ය රාජ්‍ය මූල්‍ය විනය සහ ආයතනික ප්‍රතිසංස්කරණ කෙරෙහි ශ්‍රී ලාංකේය බලධාරීන්ගේ ඇති කැපවීම අගය කරන බවය.

එමෙන්ම, ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන්ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ නීතිමය රාමුව, පාලනය, වගවීම සහ විනිවිදභාවය ශක්තිමත් කරමින් ඉදිරියේදී හඳුන්වාදීමට නියමිත නව මහ බැංකු පනත, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සපුරා ගැනීමේ පෙර දැක්ම තුළ වැදගත් සන්ධිස්ථානයක් බවට පත්වනු ඇති බවද ඇය සඳහන් කරයි.

මීට අමතරව, වෙළෙඳ සහ ආයෝජන ලිහිල්කරණය, රාජ්‍ය අංශය සතු ව්‍යවසායන්හි ප්‍රතිසංස්කරණ සහ දූෂණ විරෝධී උත්සාහයන් වේගවත් කිරීම, ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය සහ මැදිකාලීන වර්ධනය ශක්තිමත් කිරීමට වැදගත් වනු ඇති බවද මැනුඑලා ගොරෙති මහත්මිය වැඩිදුරටත් සඳහන් කරයි.